42144

AL/2018/45/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

2018.08.06 / 0830 - 1030

බෞද්ධ ශිෂ්ටාචාරය I
பௌத்த நாகரிகம் I
Buddhist Civilization I

45 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** උත්තරය තෝරාගෙන එය **උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** බ්‍රාහ්මණ වර්ණය හැඳින්වීමට 'ද්විජ' යන යෙදුම තද් සංස්කෘතිය තුළ ව්‍යවහාර වුණි. බ්‍රාහ්මණයන් දෙවරක් උපන් පූජනීය පිරිසක් ලෙස සමාජයේ ඉහළින් වැජඹීමට මෙම ද්විජ සංකල්පය උපයෝගි කර ගත් බව පෙනේ. බ්‍රාහ්මණ පිළිගැනීමට අනුව පළමුවරට මහා බ්‍රහ්මයාගේ මුවින් උපන් බමුණන් දෙවෙනි වරට උපත ලබන්නේ,
(1) ජාත කර්මයෙනි. (2) නාම කර්මයෙනි. (3) චූඩා කර්මයෙනි.
(4) උපනයන කර්මයෙනි. (5) යාග කර්මයෙනි.

**2.** බුද්ධ කාලීන භාරතීය ශ්‍රමණ සම්ප්‍රදායට අයත් බොහෝ දාර්ශනික සංකල්ප හා ආගමික ප්‍රතිපත්ති ප්‍රතික්ෂේප කළ බුදුරජාණන් වහන්සේ ඇතැම් ශ්‍රමණයන් විසින් පිළිපදින ලද ඇවතුම් පැවතුම් හා සිරිත් විරිත්වලට අනුගත වූ බව දක්නට ලැබේ. එසේ වුවත් බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායට අනන්‍ය වූ චාරිත්‍රයක් ලෙස හඳුනාගත හැකිව ඇත්තේ,
(1) වස් විසීමයි. (2) පිණ්ඩපාතයයි. (3) අනගාරික ජීවිතයයි.
(4) උපොසථයයි. (5) උපසම්පදාවයි.

**3.** "ණය වී හෝ කා බී සැප විඳිය යුතුය, මරණය යනු මෝක්ෂයයි. මරණයෙන් පසු සත්ත්වයාගේ පැවැත්මක් නැත." යනු සුඛ පරමවාදී දෘෂ්ටිවාදයකි. මෙම දර්ශනවාදයට වඩාත් සමීප ආගමික ඉගැන්වීමක් ඉදිරිපත් කළ ශාස්තෘවරයා වූයේ,
(1) අජිත කේශකම්බල ය. (2) පකුධ කච්චායන ය. (3) පූරණ කස්සප ය.
(4) මක්ඛලී ගෝසාල ය. (5) නිගණ්ඨනාතපුත්ත ය.

**4.** වෛදික යුගයේ සිටම භාරතීය චින්තකයන් විසින් සත්ත්වයා හා ලෝකය පිළිබඳ ගැඹුරින් ගවේෂණය කරනු ලැබී ය. ශ්‍රමණ සම්ප්‍රදායයේ ප්‍රභවයත් සමග මෙම තත්ත්වය වඩාත් තීව්‍ර වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස විවිධ දර්ශනවාද හඳුන්වාදීමට පෙළඹුණහ. මෙහිදී ශ්‍රමණ දාර්ශනිකයන් විසින් හඳුන්වා දෙන ලද දර්ශනවාදයක් ලෙස **නොසැලකිය** හැක්කේ,
(1) ශාස්වතවාදයයි. (2) උච්ඡේදවාදයයි.
(3) ඊශ්වර නිර්මාණවාදයයි. (4) නියතිවාදයයි.
(5) අකිරියවාදයයි.

**5.** බුද්ධ කාලීන භාරතයේ ක්‍රියාත්මක වූ බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව පහත සඳහන් ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) "කාන්තාව දැඩි පීඩනයකට යටත් කොට තිබූ අතර සති පූජාව අනිවාර්ය විය." යන්නයි.
(2) "භක්තිය පදනම් කරගත් කර්ම මාර්ගය බ්‍රහ්ම සහව්‍යතාව පිණිස එකම පිළිවෙත විය." යන්නයි.
(3) "වේද ග්‍රන්ථ දේව භාෂිත සේ පිළිගත් අතර කර්ම විපාක ප්‍රතික්ෂේප කරන ලදී." යන්නයි.
(4) "චතුර්වර්ණය අනුව සිදු කරන ලද සමාජ වර්ගීකරණය පිළිගත් පුද්ගලයා විසින් සිදු කරනු ලබන කර්මය අනුව කෙනෙකුගේ උසස් පහත් බව තීරණය වේ." යන්නයි.
(5) "ස්වධර්ම පිළිගත් අතර, බ්‍රාහ්මණ සහ ක්ෂත්‍රිය වර්ණ දෙකට අනෙක් වර්ණවලට අයත් ඕනෑම කටයුත්තක් කළ හැකිය." යන්නයි.

PAST PAPERS WIKI

[දෙවැනි පිටුව බලන්න.

**6.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් පුද්ගලයාගේ ශක්තිය හා ස්වාධීනත්වය සනාථ කිරීමෙහි ලා වඩාත් ගැළපෙන බෞද්ධ ප්‍රකාශය ලෙස හඳුනාගත හැක්කේ,
(1) "තමා උපමා කොට අනුන්ට හිංසා පීඩා නො කළ යුතුය." යන්නයි.
(2) "සියලු සත්ත්වයෝ දඬුවමට බිය ය." යන්නයි.
(3) "තමාට පිහිට තමාම මිස අන් අයගේ පිහිටක් කොයින් ද?" යන්නයි.
(4) "නීරෝගී බව පරම ලාභය වේ." යන්නයි.
(5) "පින් කරන සිල්වත් ගිහියාට ශක්‍රයා ද නමස්කාර කරයි." යන්නයි.

**7.** රාජ්‍යයේ ප්‍රභවය පිළිබඳ බෞද්ධ ආකල්පය ප්‍රකට කරන දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රාගත ඉගැන්වීම්වලින් ගම්‍ය **නොවන** ප්‍රකාශය ලෙස සැලකිය හැක්කේ,
(1) "බදු ගෙවීම ජනතාවගේ යුතුකමකි." යන්නයි.
(2) "පාලකයා වෙත ඇති බලය ජනතාව විසින් පවරාදෙන ලද්දකි." යන්නයි.
(3) "වැරදිකරුවන්ට දඬුවම්දීම පාලකයාගේ වගකීමකි." යන්නයි.
(4) "ජනතාවගේ බදු ලබාගැනීම සඳහා රජුට බලයක් ඇත." යන්නයි.
(5) "රජුට අනුශාසනා කිරීම බ්‍රාහ්මණ වර්ණයේ වගකීමකි." යන්නයි.

**8.** පහත ප්‍රකාශ අතුරෙන් දශරාජ ධර්මවලට අයත් **නොවන** කරුණක් ඇතුළත් ප්‍රකාශය කුමක් ද?
(1) දානය, ශීලය, ප්‍රඥාව, මෘදු බව, ඍජු බව
(2) ක්ෂාන්තිය, අවිහිංසාව, අක්‍රෝධය, තපෝගුණය, පරිත්‍යාගය
(3) දානය, තපෝගුණය, අක්‍රෝධය, අවිහිංසාව, පරිත්‍යාගය
(4) තපෝගුණය, ශීලය, ක්ෂාන්තිය, අවිරෝධතාව, අක්‍රෝධය
(5) අක්‍රෝධය, අවිහිංසාව, පරිත්‍යාගය, අවිරෝධතාව, දානය

**9.** දස සක්විතිවත් පිළිබඳ බෞද්ධ ඉගැන්වීමට අනුව සක්විති රජකු විසින් අනුගමනය කළ යුතු පිළිවෙතට ඇතුළත් **නොවන්නේ,**
(1) "අන්තඃපුර ජනයා කෙරෙහි රක්ෂාවරණය සංවිධානය කළ යුතුය." යන්නයි.
(2) "බල සේනාව කෙරෙහි රක්ෂාවරණය සංවිධානය කළ යුතුය." යන්නයි.
(3) "බ්‍රාහ්මණ ගෘහපතියන් කෙරෙහි රක්ෂාවරණය සංවිධානය කළ යුතුය." යන්නයි.
(4) "විවාහක අවිවාහක ස්ත්‍රීන් කෙරෙහි රක්ෂාවරණය සංවිධානය කළ යුතුය." යන්නයි.
(5) "ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි රක්ෂාවරණය සංවිධානය කළ යුතුය." යන්නයි.

**10.** සිගාලෝවාද සූත්‍රයට අනුව උතුරු දිශාවෙන් නියෝජනය වන්නේ,
(1) ආචාර්යවරුන් ය. (2) අඹු සැමියන් ය. (3) මිතුරන් ය.
(4) සේවකයන් ය. (5) මහණ බමුණන් ය.

**11.** රිය සකට කඩ ඇණය මෙන් සමාජ ප්‍රගමනය සඳහා හේතු වන ධර්ම කරුණු හතරක් සිගාලෝවාද සූත්‍රාගත සමාජ ආචාරධර්ම තුළ අන්තර්ගත වේ. එම කරුණු ඇතුළත් ධර්මපර්යාය හඳුන්වන්නේ,
(1) සතර සංග්‍රහ වස්තු නමිනි. (2) සතර බ්‍රහ්ම විහරණ නමිනි.
(3) සතර කර්ම ක්ලේශ නමිනි. (4) සතර මහාපදේස නමිනි.
(5) සතර අගති නමිනි.

**12.** අපරාධ බහුලවීම සමාජයක් භෞතික හා ආධ්‍යාත්මික වශයෙන් පරිහානියට පත්වීමට බලපාන ප්‍රධාන සාධකයකි. සමාජය තුළ අපරාධ ඇතිවීම ආකස්මික වූවක් නොව, විවිධ හේතු කරණ කොටගෙන පටිච්චසමුප්පන්නව සිදුවන බව කූටදන්තාදී සූත්‍රවලින් පැහැදිලි වේ. මෙම අපරාධ මර්දනය කිරීම රටක සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් ලෙස හඳුනාගන්නා බුදුසමය දස සක්විතිවත්වලින් ද ඒ බව පෙන්වා දී ඇත. අපරාධ සම්භවය හා ව්‍යාප්තිය විග්‍රහ කරන බෞද්ධ න්‍යායට අනුව අපරාධ මර්දනය සඳහා වඩාත් සුදුසු ක්‍රමවේදය ලෙස හඳුනාගත හැක්කේ,
(1) නීතිගරුකවීමේ වැදගත්කම පහදාදීමයි. (2) මිනිසා වරදට පොළඹවන හේතු නැති කිරීමයි.
(3) ආරක්ෂක විධිවිධාන තර කිරීමයි. (4) වැරදිකරුවන්ට දඬුවම් ලබාදීමයි.
(5) වරදට සමාව දී වැරදිකරුවන් පුනරුත්ථාපනය කිරීමයි.

**13.** පුද්ගලයා විසින්ම සිදු කරනු ලබන විවිධ ලාමක ක්‍රියා කරණකොටගෙන ඔහු ආර්ථික පරිහානියට පත්වන ආකාරය බුදුසමය පෙන්වා දෙයි. සිගාලෝවාද සූත්‍රයෙහි 'භෝගයන්ගේ අපායමුඛ' යනුවෙන් දක්වා ඇත්තේ ද එවැනි කරුණු සයකි. එම ෂඩ්විධ භෝග විනාශ මුඛවලට අයත් **නොවන** කරුණක් වන්නේ,
(1) සුරාවයි. (2) සූදුවයි. (3) පාපමිත්‍රසේවනයයි.
(4) ස්ත්‍රී ධූර්තවීමයි. (5) අලසකමයි.

PAST PAPERS WIKI

**14.** “ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, නව යොවුන් තරුණ වියෙහි සිටි මම නව යොවුන් තරුණ වියෙහි සිටි නකුල මාතාව පතිකුලයට ගෙන ආවෙමි. එතැන් පටන් මම සිතින් හෝ වෙනත් ස්ත්‍රියක් නො පැතුවෙමි. ඉදින් ඇය ඉක්මවා වෙනත් කතක් වෙත ගියේ යයි කියනු කුමට ද? භාග්‍යවතුන් වහන්ස, අප දෙදෙනා මෙලොවෙහි පමණක් නොව පරලොව දී පවා ඔවුනොවුන් දකිනු රිසියෙමි.” යි නකුල පිතු විසින් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි ප්‍රකාශ කරන ලදුව, නකුල මාතාව විසින් ද එවැනිම ප්‍රකාශයක් කරන ලදී. ඉහත ඡේදයට අනුව නකුල මාතාව හා නකුල පිතු යන දෙදෙනා,

(1) සිත කය දෙකෙන් අකුසල්වල යෙදී නැත.
(2) දස අකුසල්වලින් වෙන් ව කටයුතු කොට ඇත.
(3) පන්සිල් කඩ නොකොට ආරක්ෂා කොට ඇත.
(4) ස්ත්‍රී පුරුෂයන් කාම හේතුවෙන් අකුසල් කිරීම හෙලා දැක ඇත.
(5) මිථ්‍යාකාමයෙන් වෙන් ව කටයුතු කොට ඇත.

**15.** ඇඩි ලෝභය වනාහී නිර්වාණගාමී මාර්ගය අවුරාලන ප්‍රධාන සාධකයක් ලෙස හඳුනාගන්නා බෞද්ධයා, අනුන්ගේ වස්තුව කෙරෙහි ලෝභ සිත නූපදවමින් හැකි සෑමවිටම ලාභාපේක්ෂාවෙන් තොරව සිය ධනය දානාදී කටයුතු සඳහා යෙදවීමටත්, පරිත්‍යාගශීලීව කටයුතු කිරීමටත් පෙළඹේ. එසේම ක්‍රෝධය, වෛරය, ආඝාතය, පළිගැනීම ආදී ව්‍යාපාද නාමයෙන් හඳුන්වන තරහ සිතුවිලි උපදවාගැනීම තමාටම බොහෝ අහිත පිණිස, දුක් පිණිස හේතු වන බව දන්නා හෙතෙම ඉවසීමෙන් හා මෛත්‍රියෙන් කටයුතු කිරීමට උත්සාහ දරයි. මිථ්‍යා ඇදහිලි, විශ්වාස හා විවිධ වැරදි දෘෂ්ටීන්හි එල්බ ගැනීමෙන් මංමුලා නො වන ඔහු මෙලොව හා පරලොව ජයගෙන නිවන් සාක්ෂාත් කිරීම තම ඒකායන අරමුණ ලෙස සලකා නිවැරදි දැක්මෙන් යුතුව යථාර්ථවාදී ජීවිතයක් ගත කරයි.
ඉහත ඡේදයෙන් ගම්‍ය වන බෞද්ධ සදාචාර මාර්ගයට බාධා පමුණුවන අකුසල් ඇතුළත් ඉගැන්වීම් හඳුන්වනු ලබන්නේ,

(1) පඤ්ච නීවරණ නමිනි.
(2) දස අකුසල් නමිනි.
(3) ත්‍රිවිධ අකුසල මූලයන් නමිනි.
(4) සතර කර්මක්ලේශ නමිනි.
(5) දශ වස්තුක මිථ්‍යාදෘෂ්ටි නමිනි.

**16.** ‘සුබෝධ’ කනිෂ්ඨ විද්‍යාලයීය ස්වර්ණ ජයන්තිය වෙනුවෙන් පවත්වන ලද සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනය පිණිස මහසඟරුවන වඩමවන ලද්දේ විද්‍යාලයීය තූර්යවාදක කණ්ඩායම විසින් පවත්වන ලද ගරු බුහුමන් හා හරසර මධ්‍යයේ ය. පාධෝවනය, දැහැත් ගිලන්පස පිළිගැන්වීම ආදී සියලු වතාවත් පාසල් දරු දැරියන් විසින්ම සිදු කරන ලද අතර විදුහල්පතිතුමා විසින් දැහැත් වට්ටියක් පිරිනමා පිරිත් දේශනය පිණිස මහාසංඝරත්නයට ආරාධනා කරන ලදී. පඤ්චශීල සමාදානයෙන් අනතුරුව පිරිතෙහි අනුසස් පිළිබඳ වටිනා අනුශාසනයක් පවත්වන ලද අතර, කර්මඵල විශ්වාස කිරීමේ නුවණින් සැදැහැ සිත් පෙරදැරි ව සියලු දෙනා අනුශාසනය ද අනතුරුව පිරිත් ධර්මය ද ශ්‍රවණය කළහ. පසුදින මහාසංඝරත්නය විෂයයෙහි සැදැහැ සිතින් හීල් දානය පිරිනැමීමෙන් අනතුරුව පාසලේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කොට මියපරලොව ගිය ආදිකර්තෘන් ඇතුලු සියලු දෙනාට පැන් වඩා පිං පැමිණ වූ විදුහල්පතිතුමා ප්‍රමුඛ පිරිස තම තමන්ද පිං අනුමෝදන් ව පිංකම හමාර කළහ. ඉහත පිංකම් මාලාව තුළ දී බුදුසමයේ ඉගැන්වෙන දශ පුණ්‍යක්‍රියා අතරින් පාසල් සිසු දරු දැරියන්ට සම්පූර්ණ කරගැනීමට **නොහැකි** වූ පුණ්‍යක්‍රියාව ලෙස හඳුනාගත හැක්කේ,

(1) භාවනාවයි.
(2) පත්තිදානයයි.
(3) පත්තානුමෝදනාවයි.
(4) ශීලයයි.
(5) දෘෂ්ටිය ඍජු කරගැනීමයි.

**17.** ‘ආධිපතෙය්‍යධම්ම’ යනුවෙන් හැඳින්වෙන්නේ අධිපති ධර්මයයි. බුදුසමයෙහි අධිපති ධර්මවල උපයෝගීතාව අවධාරණය කොට ඇත්තේ,

(1) පින් පව්වල ප්‍රබලත්වය හා දුබලබව හඳුනාගැනීම පිණිස ය.
(2) ආරාම පාලනයෙහිලා ප්‍රධානත්වය හඳුනාගැනීම පිණිස ය.
(3) ධර්මයේ හරි වැරදි විනිශ්චය කරගැනීම පිණිස ය.
(4) කුසල් අකුසල් විනිශ්චය කරගැනීම පිණිස ය.
(5) විනය නීතිවල උචිත අනුචිත බව තහවුරු කරගැනීම පිණිස ය.

**18.** ආකාරවතී ශ්‍රද්ධාවේ විශේෂ ලක්ෂණයකි,

(1) වහා පැහැදී තෙරුවන් ඇදහීම.
(2) ඉල්පෙන පොපියන පැහැදීමෙන් තෙරුවන් ඇදහීම.
(3) භක්තියෙන් තෙරුවන් ඇදහීම.
(4) නිරාමිස ප්‍රීතියෙන් තෙරුවන් ඇදහීම.
(5) විමසා බලා විචාර පූර්වක ව තෙරුවන් ඇදහීම.

PAST PAPERS WIKI

**19.** බුදුරජාණන් වහන්සේ ප්‍රථම ධර්මදූත කණ්ඩායම පිටත් කරමින් "චරථ භික්ඛවෙ චාරිකං බහුජනහිතාය බහුජනසුඛාය ලෝකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දේවමනුස්සානං, මා එකෙන ද්වෙ අගමිත්ථ" යනාදී වශයෙන් දේශනා කරන ලද ප්‍රකට උපදේශය මහාවග්ග පාලියේ සඳහන් වේ. මෙම ප්‍රකාශය තුළ කළමනාකරණය පිළිබඳ මූලික බෞද්ධ ඉගැන්වීමක් අන්තර්ගත වේ. ඒ අනුව මෙම ප්‍රකාශය තුළින් ප්‍රකට වන්නේ,
(1) කාල කළමනාකරණයයි.
(2) පිරිස් කළමනාකරණයයි.
(3) ආධ්‍යාත්මික කළමනාකරණයයි.
(4) භෞතික සම්පත් කළමනාකරණයයි.
(5) පරිසර කළමනාකරණයයි.

**20.** ගෘහස්ත ජීවිතයේ ආර්ථික සමෘද්ධිය පිණිස බුදුසමයෙන් අනුමත දැහැමි ජීවනෝපායයක් ලෙස වෙළඳාම හෙවත් ව්‍යාපාරික කටයුතු දැක්විය හැකිය. ඒ අතර නො කටයුතු වෙළඳාම් පිළිබඳව ද බුදුසමය අවධාරණය කරයි. එවැනි නොකටයුතු වෙළඳාම් පහක් වණිජ්ජා සූත්‍රයෙහි පැහැදිලි ව පෙන්වා දී ඇති අතර එහි දැක්වෙන 'සත්ථවණිජ්ජා හා සත්තවණිජ්ජා' යනුවෙන් දැක්වෙන්නේ,
(1) අවිආයුධ වෙළඳාම හා සතුන් වෙළඳාමයි.
(2) මස් වෙළඳාම හා සතුන් වෙළඳාමයි.
(3) අවිආයුධ වෙළඳාම හා මස් වෙළඳාමයි.
(4) සතුන් වෙළඳාම හා මත්ද්‍රව්‍ය වෙළඳාමයි.
(5) අවිආයුධ වෙළඳාම හා වසවිස වෙළඳාමයි.

**21.** බුදුරජාණන් වහන්සේ මෙන්ම ශ්‍රාවකයන් වහන්සේලා ද ස්වභාව සෞන්දර්යය හා නිර්මාණාත්මක සෞන්දර්යය අගය කළ අවස්ථා ත්‍රිපිටක සාහිත්‍යයෙහි ඇතුළත් වේ. එසේවුව ද "නච්චගීතවාදිත විසූකදස්සන මාලා ගන්ධවිලේපන ධාරණ මණ්ඩණ විභූසනට්ඨානා වේරමණී සික්ඛා පදං සමාදියාමි" යන ශික්ෂා පදයෙන් සරාගී සෞන්දර්ය රසාස්වාදය නොකළයුතු බව ශීලය පිළිබඳ බුදුසමයාගත ඉගැන්වීම්වලින් පැහැදිලි වේ. මෙම ශික්ෂා පදයෙන් සරාගී සෞන්දර්ය රාසාස්වාදය නුසුදුසුබව දේශනා කොට ඇත්තේ,
(1) සිවුවනක් පිරිසටම ය.
(2) උපාසක උපාසිකාවන්ට ය.
(3) පෙහෙවස් සමාදන් වූ පිරිසට ය.
(4) සියලු බෞද්ධයන්ට ය.
(5) භාවනානුයෝගීන්ට ය.

**22.** බෞද්ධ පැවිදි සමාජයේ ව්‍යාප්තියත් සමග විවිධ අරමුණු සහිත පුද්ගලයෝ බුදුසසුන තුළ පැවිදි වූහ. ලාභ සත්කාර අපේක්ෂාවෙන් සසුන්ගත වූ අන්‍යතීර්ථක පැවිද්දන් ද ඒ අතර විය. මෙසේ සසුන්ගත වූ අන්‍යතීර්ථකයන්ගේ ක්‍රියා කලාපය සැබෑ බෞද්ධ සංඝ සමාජයේ පැවැත්මට හිතකර නො වීය. මේ නිසා වෙනත් සසුනක පැවිදිව සිට බුදුසසුනේ පැවිදි උපසම්පදාව අපේක්ෂා කරන අය සිවු මසක පරිවාස කාලයක් ගත කළ යුතු යැයි බුදුරජාණන් වහන්සේ විසින් කොන්දේසියක් පනවන ලදී. එහෙත් මෙම පරිවාස කාලය පිළිබඳ නියමයෙන් ශාක්‍ය වංශිකයන් නිදහස් කරන ලද අතර, එයට හේතු වූයේ,
(1) ශාක්‍ය වංශිකයන් වැරදි නො කිරීමයි.
(2) ශාක්‍ය වංශිකයන් සසුන් ගතවීමට දැක් වූ දැඩි කැමැත්තයි.
(3) ශාක්‍ය වංශිකයන් පරිවාස කාලයක් ගත කිරීමට අකමැතිවීමයි.
(4) ශාක්‍ය වංශිකයන්ට විශේෂ වරප්‍රසාදයක් ලබාදීමට බුදුරදුන්ට අවශ්‍යවීමයි.
(5) ශාක්‍ය වංශිකයන් පාලනය කිරීම පහසුවීමයි.

**23.** බුදුරජාණන් වහන්සේගේ ත්‍රිවිද්‍යා ඥාණයට අයත් වන්නේ,
(1) පුබ්බේනිවාසානුස්සති ඥාණය, පරචිත්තවිජානන ඥාණය හා ආසවක්ඛය ඥාණයයි.
(2) පුබ්බේනිවාසානුස්සති ඥාණය, දිබ්බචක්ඛු ඥාණය හා ආසවක්ඛය ඥාණයයි.
(3) පුබ්බේනිවාසානුස්සති ඥාණය, දිබ්බසොත ඥාණය හා ආසවක්ඛය ඥාණයයි.
(4) පුබ්බේනිවාසානුස්සති ඥාණය, මනෝමයඉද්ධි ඥාණය හා ආසවක්ඛය ඥාණයයි.
(5) පුබ්බේනිවාසානුස්සති ඥාණය, දිබ්බචක්ඛු ඥාණය හා දිබ්බසොත ඥාණයයි.

**24.** ආගමික සහනශීලීතාව බුද්ධ චරිතයෙන් ප්‍රකට වන විශේෂ ලක්ෂණයක් ලෙස හඳුනාගත හැකි ය. බුදුරජාණන් වහන්සේ අන්‍ය ආගමික පිරිස් සමග ඉතා සුහදව කටයුතු කළ බව සනාථ කරන සාධක ත්‍රිපිටක සාහිත්‍යයෙන් හමුවේ. බුදු සිරිතේ ඇතුළත් මෙම විශේෂ ලක්ෂණය සනාථ කිරීමෙහිලා වඩාත් ම ගැලපෙන සිදුවීම ලෙස හඳුනාගත හැක්කේ,
(1) තුන් බෑ ජටිලයන් පැවිදි කිරීමයි.
(2) සෝණදණ්ඩ බමුණා බුදුරදුන් බැහැ දැකීමට යාමයි.
(3) සංජය පිරිවැජියාගේ අතවැසියන් බුදුසසුනෙහි පැවිදි කිරීමයි.
(4) සකුළුදායී පිරිවැජියාගේ ආරාමයට වැඩම කොට ඔහු හා සාකච්ඡා කිරීමයි.
(5) උපාලි ගෘහපතියාට සිය ආචාර්යවරයා වූ නිගණ්ඨනාතපුත්ත වෙතට යන ලෙස ඇනුම්දීමයි.

PAST PAPERS WIKI

[පස්වැනි පිටුව බලන්න.

25. කෙලෙස්වලින් දූෂිත වූ සමාජයක නො කිලිටි ව, නිකෙලෙස් ව ජීවත්වීම බුද්ධ චරිතයෙන් පිළිබිඹු වන උතුම් ගුණයක් ලෙස මූලාශ්‍රයන්හි දැක්වේ. මෙම සුවිශේෂ ලක්ෂණය හැඳින්වීමට වඩාත්ම ගැලපෙන ප්‍රකාශය වන්නේ,
(1) "පක්ෂියකු මෙන් සැහැල්ලුවෙන් ජීවත්වීම" යන්නයි.
(2) "කඟවේණෙකු මෙන් හුදකලාව හැසිරීම" යන්නයි.
(3) "තාදී ගුණයෙන් යුතුව කටයුතු කිරීම" යන්නයි.
(4) "විරාගීචරණය" යන්නයි.
(5) "පද්මාකාර ජීවිතය" යන්නයි.

26. "එව මහණ, මාගේ මේ ශාසනයෙහි බ්‍රහ්මචරියාවේ හැසිරෙව." යනුවෙන් බුදුරදුන් විසින් ප්‍රකාශයට පත් කරනු ලැබීමෙන් සම්පූර්ණ වූ පැවිදි උපසම්පදා ක්‍රමය හඳුන්වන්නේ,
(1) පඤ්හව්‍යාකරණ උපසම්පදාව නමිනි.
(2) සරණාගමන උපසම්පදාව නමිනි.
(3) ඒහිභික්ඛු උපසම්පදාව නමිනි.
(4) අට්ඨවාචික උපසම්පදාව නමිනි.
(5) ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාව නමිනි.

27. 'සත්තාහකරණය' යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) භාවනාව පිළිබඳ ධර්මෝපදේශයකි.
(2) පොහොය කර්ම කිරීම පිළිබඳ විධිනියමයකි.
(3) වස් එළඹීම පිළිබඳ විධිනියමයකි.
(4) වස් පවාරණය පිළිබඳ විධිනියමයකි.
(5) වස් විසූ ස්ථානයෙන් බැහැර යාම පිළිබඳ විධිනියමයකි.

28. බුදුසසුනෙහි පළමුව තෙරුවන් සරණ ගිය උපාසකයා වූයේ
(1) බරණැස් සිටුතුමා ය.
(2) අනේපිඬු සිටුතුමා ය.
(3) යසකුල පුත්‍රයා ය.
(4) බිම්බිසාර රජතුමා ය.
(5) ඝෝෂිත සිටුතුමා ය.

29. එකම දිනක දී සිය සැමියාත්, පුතුන් දෙදෙනාත්, මව සහ පියාත්, සහෝදරයාත් මරණයට පත්වීමෙන් අසරණ වූ පටාචාරාව බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය නිසා නිවී සැනසී ශාසනික තනතුරු පවා ලැබූ බව මූලාශ්‍රයෙහි දැක්වේ. ඒ අනුව පටාචාරාව අගතනතුරට පත්වූයේ,
(1) ධර්මධර භික්ෂුණීන් අතර ය.
(2) ධුතාංගධර භික්ෂුණීන් අතර ය.
(3) විනයධර භික්ෂුණීන් අතර ය.
(4) ධර්මකථික භික්ෂුණීන් අතර ය.
(5) චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර ය.

30. බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂු භික්ෂුණීන් උදෙසා පනවන ලද කිසිදු විනය ශික්ෂාවක් වෙනස් නොකිරීමටත්, නොපනවන ලද කිසිදු විනය ශික්ෂාවක් නොපැනවීමටත් ප්‍රථම සංගීතිකාරක තෙරවරුන් විසින් තීරණය කරන ලද්දේ,
(1) ආනන්ද තෙරුන් බුදුරදුන්ගෙන් ඛුද්දානු ඛුද්දක ශික්ෂාපද මොනවාදැයි නො විමසා තිබූ හෙයිනි.
(2) මහජනතාවගෙන් එල්ල විය හැකි විරෝධතාව ද සලකා මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ඊට අකමැත්ත ප්‍රකාශ කළ හෙයිනි.
(3) විනය ශාසනයේ ආයුෂ වූ බැවින් විනය නීති වෙනස් කිරීම ශාසනයේ පරිහානියට හේතු වේ යයි සැලකූ හෙයිනි.
(4) වෙනස් කළ යුතු ශික්ෂාපද මොනවා දැයි නිශ්චය කරගත නොහැකි වූ හෙයිනි.
(5) පනවා තිබූ සියලු ශික්ෂාපද භික්ෂු ජීවිතයට අනිවාර්ය යයි සැලකූ හෙයිනි.

31. වජ්ජිපුත්තක භික්ෂූන් විසින් කැප යයි පිළිගෙන පිළිපදින ලද දස වස්තුවෙහි දැක්වෙන 'අදසකනිසීදනකප්ප' යනු,
(1) එක් සීමාවක පිහිටි කුඩා කුඩා ආවාසවල වෙන වෙනම සිටිමින් පොහොය කිරීම කැප බව ය.
(2) විමසා බැලීමකින් තොරව පාරම්පරික දේ පිළිගැනීම කැප බව ය.
(3) දාවලු නැති ඇඳ ඇතිරිලි පරිහරණය කැප බව ය.
(4) එක් සීමාවක් තුළ වාසය කරන භික්ෂූන්ගේ කැමැත්ත නොගෙන වෙන් වෙන්ව පොහොය කොට පසුව කැමැත්ත ගැනීම කැප බව ය.
(5) වරක් වළඳා අවසන් කොට තවත් ගමකට ගොස් එහි සිට නැවත වැළඳීම කැප බව ය.

32. ධර්මාශෝක රාජ්‍ය සමයේ භික්ෂූන් වහන්සේලා වසර ගණනාවක් පොහොය කර්ම කිරීමෙන් වැළකී සිටි බව මූලාශ්‍රය වාර්තාවල දැක්වේ. එසේ පොහොය කර්ම නොකිරීමට හේතුව ලෙස දැක්වෙන්නේ,
(1) පොහොය සීමා නොමැතිවීමයි.
(2) රාජ්‍යානුග්‍රහය නොලැබීයාමයි.
(3) උපසපන් භික්ෂූන් නො සිටීමයි.
(4) දුස්සීල භික්ෂූන් සුලභවීමයි.
(5) අන්‍යාගමික තර්ජන බහුලවීමයි.

Past Papers Wiki
PAST PAPERS WIKI

**33.** පැරණි භාරතීය විශ්වවිද්‍යාලයක කීර්තිමත් ආචාර්යවරයකු වූ ශාන්තරක්ෂිත හිමියන් ප්‍රමුඛ මහායාන පඬිවරයෙකි. උන්වහන්සේ ආචාර්යවරයකු වශයෙන් සේවය කෙළේ,
(1) නාලන්දා විශ්වවිද්‍යාලයේ ය. (2) වික්‍රමශිලා විශ්වවිද්‍යාලයේ ය.
(3) ඕදන්තපුරී විශ්වවිද්‍යාලයේ ය. (4) වලභි විශ්වවිද්‍යාලයේ ය.
(5) ජගද්දලා විශ්වවිද්‍යාලයේ ය.

**34.** තෙවන ධර්ම සංගායනාවේදී ගනු ලැබූ තීරණයකට අනුව භාරතය තුළ හා භාරතයෙන් පිටත පිහිටි රටවල් නවයකට ධර්මදූතයන් වහන්සේලා පිටත් කර යවන ලදී. මෙම වැඩපිළිවෙළ අනුව මහාදේව හිමියන්ට වැඩම කිරීමට ලැබුණේ,
(1) මහිස මණ්ඩලයටයි. (2) හිමවන්ත දේශයටයි.
(3) යෝනක දේශයටයි. (4) වනවාස දේශයටයි.
(5) අපරන්ත දේශයටයි.

**35.** බුදුසසුන වෙනුවෙන් සුවිශේෂ කාර්යභාරයක් ඉටු කළ කණිෂ්ක රජතුමා ධර්ම සංගායනාවක් සඳහා අනුග්‍රහය දැක්වීමට පෙළඹුණේ,
(1) දුසිල් මහණුන් සසුනින් නෙරපීමට අවශ්‍ය වූ බැවිනි.
(2) සංගායනාවක අවශ්‍යතාව භික්ෂූන් විසින් පෙන්වාදෙන ලද බැවිනි.
(3) අශෝක අධිරාජයා විසින් බුදුසසුනට සිදුකරන ලද මෙහෙයට නොදෙවෙනි මෙහෙයක් සිදු කිරීමට තමන්ට ද අවශ්‍ය වූ බැවිනි.
(4) ගොපලු වෙසින් පැමිණි දෙවියකු විසින් "අනාගතයේ දී කණිෂ්ක නම් රජ කෙනෙකු ධර්ම සංගායනාවක් පවත්වන්නේ ය." යි බුදුරදුන් විසින් දේශනා කොට ඇති බව පවසන ලද බැවිනි.
(5) "සංගායනාවක් පැවැත්වීම බෞද්ධ නරපතියකු විසින් සිදු කළ යුතු අනිවාර්ය කටයුත්තකි." යන සම්මතයක් පැවති බැවිනි.

**36.** රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ප්‍රතිපත්තියට අනුව සිය පාලන තන්ත්‍රය මෙහෙයවීමට උත්සුක වූ සිරිසඟබෝ රජු,
(1) පඤ්චශීල ප්‍රතිපදාව මත කටයුතු කළ ද සොරකම් කරන්නන්ට මරණ දඬුවම පමුණුවන බව ප්‍රසිද්ධ කිරීමට ක්‍රියා කෙළේ ය.
(2) සතර පොහොය දිනවල ගොඩබිම සතුන්ට මෙන්ම ජලජ සතුන්ට ද අභයදානය දීමට කටයුතු කෙළේ ය.
(3) මත්පැන් පානය කරන්නා කිසිදු කටයුත්තකට නොහොබිනේ යයි ප්‍රකාශ කෙළේ ය.
(4) මාඝාත නීතිය පැනෙව්වේ ය.
(5) බොරු නඩු පවරන්නන් සිරගත කෙළේ ය.

**37.** ලංකා ශාසන ඉතිහාසයේ මහත් ආන්දෝලනයක් ඇති කරමින් නව ප්‍රතිසංස්කරණවාදී අදහස් ඉදිරිපත් කළ ආයතනයක් ලෙස අභයගිරි විහාරය හඳුන්වා දිය හැකි ය. මහායාන බුදුදහම ලක්දිව ප්‍රචලිත කිරීමෙහි ලා පහසුකම් සැපයූ අභයගිරිය, මහා විහාරය සතු ඇතැම් ආයතන හා සම්පත් ද තමන් සතු කරගත් බව ශාසන ඉතිහාසයෙන් තහවුරු වේ. එවැනි එක් අවස්ථාවක් ලෙස සැලකිය හැක්කේ,
(1) මහාකාලසිලා ප්‍රතිමාව තමා සන්තක කර ගැනීමයි.
(2) තොලුවිල ප්‍රතිමාව තමා සන්තක කර ගැනීමයි.
(3) ථූපාරාමය පවරා ගැනීමයි.
(4) වෙස්සගිරිය පවරා ගැනීමයි.
(5) දළදා වහන්සේ තමා සන්තක කර ගැනීමයි.

**38.** ප්‍රාග් බෞද්ධ ශ්‍රී ලංකාවේ දෙවියන් ඇදහීම යක්ෂ වන්දනය මෙන්ම වෙනත් විවිධ ආගමික විශ්වාස පැවති බව මහාවංසාදී වාර්තාවලින් තහවුරු වේ. නගරයේ බස්නාහිර දොරටුව සමීපයේ නුග ගසක් වෙන්කොට තිබුණේ එසේ වන්දනීයත්වයට පත් එක්තරා දෙවියකු වෙනුවෙනි. මහායාන ඉගැන්වීම් අනුව ද දේවත්වයෙන් පුදනු ලැබූ මොහු,
(1) කම්මාර දෙවියා ය. (2) ව්‍යාධ දෙවියා ය.
(3) වෛශ්‍රවණ දෙවියා ය. (4) විභීෂණ දෙවියා ය.
(5) ධෘතරාෂ්ට්‍ර දෙවියා ය.

**39.** ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය වඩාත් ස්ථාවරත්වයට පත් වූයේ ක්‍රි.ව. 5 වන සියවසේ හෙළ අටුවා ග්‍රන්ථ පාලියට පරිවර්තනය කිරීමට විදෙස් රටවල සිට මෙරටට පැමිණි විද්වත් භික්ෂූන් වහන්සේලාගේ කාර්යභාරය කරණකොට ගෙන ය. එසේ පැමිණි භික්ෂූන් වහන්සේලා අතර බුද්ධඝෝෂ හිමියන් සුවිශේෂ වේ. බුද්ධඝෝෂ හිමියන්ට සමකාලීන ව භාරතයේ සිට පැමිණි තවත් පරිවර්තක භික්ෂුවක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) සංඝමිත්‍ර හිමියන් ය. (2) බුද්ධදත්ත හිමියන් ය. (3) මහාතිස්ස හිමියන් ය.
(4) මහානාම හිමියන් ය. (5) උපසේන හිමියන් ය.

PAST PAPERS WIKI

**40.** බුරුමයට බුදුසමය හඳුන්වාදීමට පෙර එරට වැසියන්ගේ ප්‍රධාන ආගමික ඇදහීම වූයේ නාත් වන්දනය යි. බුදුදහම හඳුන්වාදීමෙන් අනතුරුව ද බුරුම වැසියන් නාත් වන්දනයෙන් සපුරා නිදහස් නොවූ බවට සාධක පවතියි. බුදුදහම බුරුමයේ රාජ්‍ය ආගම බවට පත් කළ අනව්රථ රජතුමා නාත් භූතයන් තිස්හය දෙනාගේ ප්‍රතිමා ස්වේදගොන් දාගැබ වටා ඉදිකිරීම ඊට කදිම නිදසුනක් ලෙස දැක්විය හැකි අතර රජු එම ක්‍රියාදාමයෙන් අපේක්ෂා කෙළේ,

(1) රජු තුළ නාත් භූතයන් පිළිබඳ ව පැවති බිය ප්‍රකට කිරීමයි.
(2) ස්තූපය ආරක්ෂා කිරීමේ කාර්යය නාත් භූතයන් වෙත පැවරීමයි.
(3) සියලු ආගම්වලට සමාන ව සලකන බව තහවුරු කිරීමයි.
(4) ස්තූපය නිර්මාණය කිරීම පිළිබඳ ව නාත් භක්තිකයන් තුළ පැවති විරෝධය සමනය කිරීමයි.
(5) නාත් වන්දනය සපුරා ප්‍රතික්ෂේප නොකර, ඊට සමගාමී ව බුදුදහම ප්‍රචලිත කිරීමයි.

**41.** ක්‍රි.ව. 1871 බුරුමයේ මණ්ඩලේ නුවරදී පවත්වන ලද පඤ්චම ධර්ම සංගායනාව අවසානයේදී සිදුකරන ලද ප්‍රමුඛ කාර්යයක් ලෙස සැලකිය හැක්කේ,

(1) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමයි.
(2) ත්‍රිපිටකය මුඛ පරම්පරාගත ව පවත්වාගෙන යාමට භාණක පරපුරක් ඇති කිරීමයි.
(3) දුසිල් මහණුන් සසුනින් නෙරපීමයි.
(4) ත්‍රිපිටකය කිරිගරුඬ පුවරුවල කොටවා ලෝකමාරජින දාගැබ වටා තැන්පත් කිරීමයි.
(5) ත්‍රිපිටක ග්‍රන්ථ තදාසන්න රාජ්‍යයන් වෙත යවා ආරක්ෂා කිරීමයි.

**42.** ශ්‍රී ලංකාව හා ථායිලන්තය අතර අතීතයේ සිට පැවති සංස්කෘතික සබඳතා දෙරටේම බුදුසමයේ පෝෂණයට හේතු වූ අතර විශේෂයෙන් ලක්දිව බුදුසමයේ උන්නතිය විෂයයෙහි එමගින් ලැබුණු පිටිවහල ඉමහත් ය. ඒ අනුව දෙරට අතර පැවති ප්‍රබල සංස්කෘතික සබඳතා තහවුරු කරන සිදුවීමක් ලෙස හඳුනාගත හැක්කේ,

(1) ශ්‍යාමෝපාලි නිකාය පිහිටුවීමයි.
(2) අමරපුර නිකාය පිහිටුවීමයි.
(3) රාමඤ්ඤ නිකාය පිහිටුවීමයි.
(4) දෙරටේ පාලි ත්‍රිපිටකය සසඳා බැලීමයි.
(5) ආපදාපන්න අවස්ථාවලදී ශ්‍රී ලාංකේය භික්ෂූන්ට ආරක්ෂාව සලසාදීමයි.

**43.** ක්‍රි.ව. 6 වෙනි සියවසේ කොරියානු දූත පිරිසක් විසින් ජපානයට බුදුදහම හඳුන්වාදීමෙන් පසු සාම්ප්‍රදායික ෂින්තෝ භක්තික කුලවතුන් බුදුදහම ව්‍යාප්තවීමට එරෙහි ව, බුදුදහම පිළිගත් පිරිස සමග යුධ වදිද්දී දිවිහිමියෙන් එය රැක ගැනීමට ක්‍රියා කෙළේ

(1) කිම්මෙයි අධිරාජයා ය.
(2) ෂෝතොකුතයිෂි ය.
(3) සොග වංශිකයන් ය.
(4) මොනොනොබෙ වංශිකයන් ය.
(5) නකතොමි වංශිකයන් ය.

**44.** ජපානයේ ප්‍රකට බෞද්ධ උත්සව අතර 'හනමත්සුරි' යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) මළවුන් පිදීමේ උත්සවයයි.
(2) තේ පානෝත්සවයයි.
(3) ශාක්‍යමුනි බුදුරදුන්ගේ පරිනිර්වාණ උත්සවයයි.
(4) ශාක්‍යමුනි බුදුරදුන්ගේ බුද්ධත්වය සැමරීමේ උත්සවයයි.
(5) ශාක්‍යමුනි බුදුරදුන්ගේ උපන්දින උත්සවයයි.

**45.** චීනය තුළ බුදුසමය සංවර්ධනය හා ව්‍යාප්තිය සිදුවූයේ චීන භික්ෂු භික්ෂුණීන්ගේ ඉමහත් කැපවීම හා අධිරාජවරුන්ගේ නොමඳ අනුග්‍රහය ද කරණකොටගෙනයි. මෙහිලා, හැං සහ ටැං අධිරාජ්‍ය යුගයන්හි දී චීන භික්ෂූන්ගේ මූලිකත්වයෙන් සිදුකරන ලද ශාස්ත්‍රීය කාර්යය චීනය තුළ බුදුසමය ව්‍යාප්තවීමට හා චිරස්ථායි වීමට බෙහෙවින් ඉවහල් විය. එම සුවිශේෂ ශාස්ත්‍රීය කාර්යය වූයේ,

(1) යුවාන් නමින් බෞද්ධ දේශනා ක්‍රමය ව්‍යාප්ත කිරීමයි.
(2) මහායාන බෞද්ධ ග්‍රන්ථවලට අටුවා සම්පාදනය කිරීමයි.
(3) භාරතයේ සිට බෞද්ධ ධර්ම විනය ග්‍රන්ථ ගෙන්වා ගැනීමයි.
(4) බෞද්ධ වචන තිස්පන් දහසක් පමණ චීන භාෂාවට එක් කිරීමයි.
(5) බෞද්ධ අධ්‍යාපනය සඳහා විහාරස්ථාන මුල් කරගෙන අධ්‍යාපන ආයතන බිහිකිරීමයි.

**46.** බුදුපිළිම නිර්මාණකරණයේදී බුදුරජාණන් වහන්සේගේ අත් සහ ඇඟිලි උපයෝගී කරගෙන නිර්මාණය කරනු ලබන හස්ත සන්නිවේදන ක්‍රමය මුද්‍රා නමින් හැඳින්වේ. භාරතයේ හා ශ්‍රී ලංකාවේ බුදුපිළිමවල මෙවැනි ප්‍රකට මුද්‍රා හයක් සොයාගෙන ඇත. මෙම මුද්‍රා අතර අභය මුද්‍රාව නිරූපණය වන බුද්ධ ප්‍රතිමාවක් ලෙස හඳුනාගත හැක්කේ,

(1) මහමෙව්නාවේ සමාධි ප්‍රතිමාවයි.
(2) අවුකන ප්‍රතිමාවයි.
(3) පොළොන්නරුව ගල් විහාරයේ පිහිටි ප්‍රතිමාවයි.
(4) බරණැස සාරානාත් බුද්ධ ප්‍රතිමාවයි.
(5) බදුලු දිස්ත්‍රික්කයෙන් හමු වී දැනට කොළඹ කෞතුකාගාරයේ තැන්පත් කොට ඇති ප්‍රතිමාවයි.

PAST PAPERS WIKI

[අටවැනි පිටුව බලන්න.

**47.** අනුරාධපුර ථූපාරාම ස්තූපය වට කොට චේතියඝරයක් නිර්මාණය කර තිබූ බව පුරාවිද්‍යාත්මක සාධක මගින් තහවුරු වී ඇත. මෙම චේතියඝරය ඉදිකරන ලද්දේ,
(1) දේවානම් පියතිස්ස රජතුමා විසිනි. (2) පළමුවන මුගලන් රජතුමා විසිනි.
(3) ධාතුසේන රජතුමා විසිනි. (4) දුටුගැමුණු රජතුමා විසිනි.
(5) වසභ රජතුමා විසිනි.

**48.** ගාන්ධාර සම්ප්‍රදායට අයත් බුද්ධ ප්‍රතිමාවල විශේෂ ලක්ෂණයක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) දෙනෙත් අඩවන් ව තිබීමයි.
(2) කම්මුල් පිම්බී තිබීමයි.
(3) හිසකෙස් කැරලි ගැසී ශෛලීගත ව තිබීමයි.
(4) දෙනෙත් විවෘත ව තිබීමයි.
(5) අත් සිරුරින් ඈත් ව පිහිටා තිබීමයි.

**49.** අජන්තා සම්ප්‍රදාය අනුව නිර්මාණය කොට ඇතැයි සැලකෙන සීගිරි සිතුවම් අද්විතීය ශ්‍රී ලාංකේය කලා නිර්මාණයකි. සීගිරියෙහි අලංකාර කාන්තා සිතුවම් පන්සියයක් පමණ පෙර දවස පැවති බව සීගිරි කුරුටු ගී වලින් පැහැදිලි වේ. එහෙත් දැනට ශේෂව ඇත්තේ සිතුවම් කිහිපයක් පමණි. රන්වන් හා නිල්වන් පාටින් යුක්ත මෙම කාන්තා සිතුවම් පිළිබඳ විවිධ විචාරකයන් විසින් විවිධ මත ඉදිරිපත් කොට ඇත. මෙම විචාරක මත අතර එච්.සී.පී. බෙල් මහතාගේ මතය වන්නේ, සීගිරි සිතුවම්වලින්,
(1) අප්සරාවන් නිරූපණය වන බවයි.
(2) කාශ්‍යප රජුගේ බිසෝවරුන් හා සේවිකාවන් මල් රැගෙන පිදුරංගල විහාරයට වන්දනාවේ යාම නිරූපණය වන බවයි.
(3) විදුලිය හා මේඝය නිරූපණය වන බවයි.
(4) කාශ්‍යප රජුගේ අභාවයෙන් ශෝක වන බිසෝවරුන් නිරූපණය වන බවයි.
(5) කුවේරයාගේ ආලකමන්දාව නිරූපණය වන බවයි.

**50.** සිංහල සාහිත්‍යය ප්‍රධාන වශයෙන් ම පෝෂණය වූයේ බුදුදහමෙන් බව පැරණි ශ්‍රී ලාංකේය සාහිත්‍ය කෘති පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වේ. අතීත ශ්‍රී ලාංකික ගත්කරුවෝ බුදු ගුණ හා විවිධ බෞද්ධ තේමා පාදක කරගෙන සාරවත් සාහිත්‍ය නිර්මාණ සිදු කළහ. දඹදෙණි යුගයේ දී ධර්මසේන හිමියන් විසින් රචනා කරන ලද සද්ධර්මරත්නාවලිය ද එවැනි උසස් සාහිත්‍ය නිර්මාණයකි. මේ අනුව සද්ධර්මරත්නාවලිය රචනා කිරීම පිණිස පාදක කර ගනු ලබන්නේ,
(1) බුදුරජාණන් වහන්සේගේ අරහං ගුණයයි.
(2) බුදුරජාණන් වහන්සේගේ පුරිසදම්ම සාරථී ගුණයයි.
(3) බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුද්ධ ගුණයයි.
(4) බෝසත් පාරමිතා ගුණ වර්ණනා කරන ජාතකට්ඨ කථාවයි.
(5) ධම්මපද ගාථා විවරණය කිරීමට රචිත ධම්මපදට්ඨ කථාවයි.

* * *

PAST PAPERS WIKI

42144

AL/2018/45/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

**බෞද්ධ ශිෂ්ටාචාරය II**
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

45 S II

2018.08.07 / 0830 - 1140

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

1. (i) චතුර්විධ ආශ්‍රම ධර්ම හඳුන්වා දෙන්න.
(ii) බ්‍රාහ්මණ වර්ණයේ ප්‍රභවය පිළිබඳ බුදුසමයේ ආකල්පය පැහැදිලි කරන්න.
(iii) බුද්ධ කාලීන භාරතීය සමාජය නාගරීකරණයට ලක්ව තිබූ බවට සාධක **හතරක්** ගෙනහැර දක්වන්න.
(iv) අජිතකේසකම්බලගේ දසවස්තුක මිථ්‍යාදෘෂ්ටිය හඳුන්වා දෙන්න.
(v) බුදුරජාණන් වහන්සේ හා වජ්ජි ජනපදය අතර පැවති සබඳතා තහවුරු කරන සාධක **හතරක්** ගෙනහැර දක්වන්න.

2. (i) ඊශ්වර නිර්මාණවාදය මගින් පුද්ගල ස්වාමිත්වය සීමාකරන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න.
(ii) කාන්තාව බුදුසමයෙන් ඇගයීමට ලක් වූ අවස්ථා **තුනක්** ගෙනහැර දක්වන්න.
(iii) "පරිත්‍යාගය" බෞද්ධ දේශපාලන ඉගැන්වීමක් ලෙස විග්‍රහ කරන්න.
(iv) සිගාලෝවාද සූත්‍රය අනුව මිතුරන් හා මිතුරන් අතර පැවතිය යුතු යුතුකම් හා වගකීම් නම් කරන්න.
(v) කාමමිථ්‍යාචාරයෙන් වැළකීමේ වටිනාකම කෙටියෙන් දක්වන්න.

3. (i) දස කුසල් නම් කරන්න.
(ii) අත්තුපනායික ධර්මපර්යාය පිළිබඳ විවරණයක් සපයන්න.
(iii) "අත්ථිසුඛය" යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
(iv) "සමජීවිකතාව" මූලාශ්‍රය ඇසුරින් පහදා දෙන්න.
(v) බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතයෙන් වර්තමාන සමාජයට ලබා ගත හැකි ආදර්ශය කෙටියෙන් දක්වන්න.

## II කොටස

4. (i) "අධික තෘෂ්ණාව සමාජ ගැටලු ඇතිවීමට ඉවහල් වේ". බෞද්ධ ඉගැන්වීම ඇසුරින් සාකච්ඡා කරන්න.
(ii) 'ස්වච්ඡන්දතාව' පුද්ගල හා සමාජ සංවර්ධනයට ඉවහල් වන අයුරු බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් ප්‍රකට කරන්න.
(iii) ධාර්මික ධනෝපාර්ජන මාර්ග ලෙස කෘෂිකර්මාන්තය හා සත්ත්ව පාලනය බුදුදහමේ අගය කොට ඇති ආකාරය පැහැදිලි කරන්න.
(iv) සම්පත් පරිභෝජනය පිළිබඳ බෞද්ධ ආකල්පය සමාජ සහජීවනයට ඉවහල් වන ආකාරය "භෝග සුඛය" ඇසුරින් පෙන්වා දෙන්න.

[ දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki
PAST PAPERS WIKI

5. (i) බුදුරජාණන් වහන්සේ සතුව පැවති "ඥාන විශේෂ" පිළිබඳ හැඳින්වීමක් කරන්න.
(ii) ශාස්තෘවරයකු වශයෙන් බුදුරජාණන් වහන්සේගේ සාර්ථකත්වයට බලපෑ හේතු සාධක විමර්ශනය කරන්න.
(iii) බුද්ධ කාලීන භාරතයේ පැවති රාජාණ්ඩු නම් කොට රාජාණ්ඩුවල ක්‍රියාත්මක වූ පරිපාලන ව්‍යුහය ගෙනහැර දක්වන්න.
(iv) උපසම්පදා ක්‍රම නම් කොට ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාව හඳුන්වා දෙන්න.

6. (i) බුද්ධ කාලීන භාරතය තුළ බුදුදහමේ ශීඝ්‍ර ව්‍යාප්තියට බලපෑ හේතු සාධක සැකෙවින් දක්වන්න.
(ii) තෙවන ධර්ම සංගායනාව ශාසනයේ චිරස්ථිතිය හා ව්‍යාප්තිය විෂයයෙහි දායක වූ අයුරු පැහැදිලි කරන්න.
(iii) අශෝක ධර්මය සකස් කර ගැනීමේදී බුදුදහමෙන් ලද ආභාසය කෙතෙක්දැයි පරීක්ෂා කරන්න.
(iv) පැරණි භාරතීය බෞද්ධ විශ්වවිද්‍යාලවලින් සිදු වූ ධර්මශාස්ත්‍රීය සේවාව ඇගයීමට ලක් කරන්න.

7. (i) භාරතීය සම්භවයක් සහිත ආගම් මහින්දාගමනයට පෙර ලක්දිව ප්‍රචලිත ව පැවති බව මූලාශ්‍රයානුසාරයෙන් පෙන්වා දෙන්න.
(ii) මිහිඳු හිමියන්ගේ ධර්මදූත සේවාවෙහි සාර්ථකත්වය කෙරෙහි බලපෑ හේතු යුක්ති විමර්ශනය කරන්න.
(iii) ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ බෞද්ධ ප්‍රබෝධය ඇති කිරීමට අභයගිරි සම්ප්‍රදායයෙන් ඉටු වූ මෙහෙය අගය කරන්න.
(iv) බුරුම ශ්‍රී ලංකා සංස්කෘතික සබඳතා දෙරටෙහිම බුදුසමයේ පෝෂණයට ඉවහල් වූ ආකාරය පරීක්ෂා කරන්න.

8. (i) බුද්ධ ප්‍රතිමා නිර්මාණයේදී යොදා ගත් විවිධ මුද්‍රා සනිදර්ශනව හඳුන්වා දෙන්න.
(ii) භාරතීය සාංචි ස්තූපයට සාපේක්ෂව ශ්‍රී ලාංකේය ස්තූපවල පවත්නා ආකෘතිකමය වෙනස්කම් පෙන්වා දෙන්න.
(iii) සඳකඩපහණ ශ්‍රී ලාංකේය බෞද්ධ කලාවේ අනන්‍යතාව තහවුරු කරන නිර්මාණයක් ලෙස ඇගයීමට ලක් කරන්න.
(iv) සිංහල සාහිත්‍යයේ පෝෂණයට බුදුදහමෙන් ලැබුණු පිටිවහල සාහිත්‍ය කෘති **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

* * *

PAST PAPERS WIKI